# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 51 දරන ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 දෙසැම්බර් මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 දෙසැම්බර් මස 21 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 51 දරන ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 දෙසැම්බර් මස 11 වන දින]

එල්. ඩී.—ඕ. 61/72

**ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතන පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 51 දරන ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** 1962 අංක 14 දරන පනතින් සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතන පනතේ 5 වන වගන්තියෙහි (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ :— 164 වන අධිකාරයෙහි 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) මණ්ඩලය—

(අ) එක් එක් සාමාජිකයා විද්‍යාව හෝ කර්මාන්ත පිළිබඳව විශිෂ්ටත්වයක් ලබා ඇති හෝ ආයතනයෙහි කටයුතුවල යම් අංශයක් සම්බන්ධයෙන් අන් ලෙසකින් විශේෂයෙන් සුදුසුකම් ලබා ඇති තැනැත්තකු වූ ද අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන්නා වූ ද සාමාජිකයන් තිදෙනකුගෙන් ;

(ආ) ක්‍රම සම්පාදන විෂය හෝ කාර්යය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයකුගෙන් ;

(ඇ) මුදල් කටයුතු විෂය හෝ කාර්යය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයකුගෙන් ;

(ඈ) කෘෂි කර්මාන්ත විෂය හෝ කාර්යය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයකුගෙන් ;

(ඉ) වැවිලි කර්මාන්ත විෂය හෝ කාර්යය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයකුගෙන් ; සහ

(ඊ) නිල බලයෙන් පත් වූ පහත සඳහන් සාමාජිකයන් දෙදෙනාගෙන්, එනම්—

(i) ආයතනය යම් අමාත්‍යාංශයක් යටතේ ක්‍රියාත්මක වේ ද, තත් කාලයෙහි ඒ අමාත්‍යාංශයෙහි ලේකම් ධුරය දරන තැනැත්තාගෙන් හෝ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයෙහි වෙනත් නිලධරයකුගෙන්, සහ

(ii) තත් කාලයෙහි ආයතනයෙහි අධ්‍යක්ෂ ධුරය දරන තැනැත්තාගෙන්

සමන්විත වන්නේ ය.".

2—ඡ 02201—9,632 (73/10)

ප්‍රධාන පනතෙහි 7 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

3. ප්‍රධාන පනතෙහි 7 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" නිල බලයෙන් පත්වූ සාමාජික යන් නො වන මණ්ඩලයේ සාමාජිකයන් ගේ ධුර කාලය.

7. නිල බලයෙන් පත් වූ සාමාජිකයකු නො වන මණ්ඩලයේ යම් සාමාජිකයකු කලින් සිය ධුරය අත්හැරිය හොත් මිස අවුරුදු හතරක කාලයක් ධුරය දැරිය යුතු අතර, නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතු ය :

එසේ වුව ද —

(අ) 5 වන වගන්තියෙහි (2) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ මණ්ඩලයේ පළමුවන රැස්වීමේදී, 5 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි (අ) සිට (ඉ) දක්වා වූ ඡේදවල සඳහන් සාමාජිකයන් හත් දෙනාගෙන් තුන් දෙනකු, අවුරුදු දෙකක ආරම්භක කාලයක් ධුර දරනු පිණිස කුසපත් ඇදීමෙන් තෝරා ගනු ලැබිය යුතුය. ඒ සාමාජිකයන් තුන් දෙනාගෙන් එක් එක් සාමාජිකයා, තම ධුරය ඔහු කලින් අත්හැරිය හොත් මිස, එකී සාමාජිකයන් හත් දෙනාගෙන් තුන් දෙනකුගේ හෝ හතර දෙනකුගේ ධුර කාලය සෑම අවුරුදු දෙකකට වරක් අවසාන වන ආවර්තන පිළිවෙළක් ඇති වන පරිදි, එම කාලය තුළ ධුරය දැරිය යුතු ය. තවද

(ආ) නිල බලයෙන් පත් වූ සාමාජිකයකු නොවන මණ්ඩලයේ යම් සාමාජිකයකු සිය ධුර කාලය ඉකුත් වීමට පෙර සිය ධුරය අත්හැරිය හොත්, ඔහුගේ අනුප්‍රාප්තිකයා තමා ද කලින් සිය ධුරය අත්හැරිය හොත් මිස ඒ ධුර කාලයෙන් නොගෙවී ඇති කොටස සඳහා එම ධුරය දැරිය යුතුය. ".

ප්‍රධාන පනතෙහි 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන පනතේ 9 වන වගන්තියෙහි (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (2) සභාපති, සභාපති වශයෙන් වූ සිය ධුරය කලින් අත්හැරිය හොත් මිස, අවුරුදු හතරක් එම ධුරය දැරිය යුතුය. එහෙත් ඔහු ඒ ධුරයට නැවත පත් කරනු ලැබීම සඳහා සුදුසු විය යුතුය. ".

5. ප්‍රධාන පනතෙහි 12 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර එම වගන්ති ඒ පනතෙහි 12අ වන වගන්තිය, 12ආ වන වගන්තිය සහ 12ඇ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :— 12අ වන, 12ආ වන සහ 12ඇ වන අලුත් වගන්ති ප්‍රධාන පනතෙහි ඇතුළත් කිරීම.

"පර්යේෂණ සැලසුම් සභාවක් පත් කිරීම.

12 අ. (1) ආයතනයේ අධ්‍යක්ෂගෙන්, (පර්යේෂණ පිළිබඳ) නියෝජ්‍ය අධ්‍යක්ෂගෙන්, ප්‍රධාන ඉංජිනේරු තැනගෙන්, පර්යේෂණ අංශවල ප්‍රධානීන්ගෙන් සහ ආයතනයේ සේවයෙහි නියුක්තව නො සිටින්නා වූ ද එක් එක් තැනැත්තා විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව හෝ කර්මාන්ත පිළිබඳ විශිෂ්ටත්වයක් ලබා ඇත්තා වූ ද වෙනත් තැනැත්තන් සය දෙනකුගෙන් සමන්විත වූ, පර්යේෂණ සැලසුම් සභාව යනුවෙන් නම් කරනු ලබන විද්‍යාත්මක උපදේශක සභාවක් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) පර්යේෂණ සැලසුම් සභාවේ කාර්යයන් ද ඒ සභාවේ රැස්වීම් පවත්වන ක්‍රමය හා ආකාරය ද අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

ආයතනයේ සේවයෙහි නියුක්තව නො සිටින සාමාජිකයන්ගේ ධුර කාලය.

12ආ. ආයතනයේ සේවයෙහි නියුක්තව නො සිටින, පර්යේෂණ සැලසුම් සභාවේ යම් සාමාජිකයකු, කලින් ධුරය අත්හැරිය හොත් මිස, අවුරුදු හතරක කාලයක් ධුරය දැරිය යුතු අතර නැවත පත් කරනු ලැබීම සඳහා ඔහු සුදුසු වන්නේ ය.

ධුරය අත්හැරීම.

12ඇ. ආයතනයේ සේවයෙහි නියුක්තව නො සිටින පර්යේෂණ සැලසුම් සභාවේ යම් සාමාජිකයකු—

(අ) අමාත්‍යවරයා වෙත යවනු ලබන තමා අත්සන් කළ ලියවිල්ලකින් සිය ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් ; හෝ

(ආ) වස්තු භංගත්වයට පත් වූවකු ලෙස හෝ බුන්වතකු ලෙස විනිශ්චය කරනු ලැබ, ඔහුගේ වස්තු භංගත්වය හෝ බුන්වත් භාවය, සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන්, නො වැළැක්විය හැකි පාඩු හෝ අභාග්‍යයක් නිසා සිදු වී ඇති බව දැක්වෙන සහතිකයක් නිසි බලය ඇති අධිකරණයක් විසින් ඔහුට නිකුත් කර නැතහොත් ; හෝ

(ඇ) උමතු යැ යි නිසි බලය ඇති අධිකරණයක් විසින් විනිශ්චය කරනු ලැබුවහොත්,

ඒ සාමාජිකයා ඔහුගේ ධුරය අත්හැරියා විය යුතු ය.".

ප්‍රධාන පනතෙහි උපලේඛනය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන පනතේ උපලේඛනයෙහි (5) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් එම උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(5) මණ්ඩලයෙහි යම් රැස්වීමකදී ගණපූරණය සාමාජිකයන් හතර දෙනකු විය යුතු ය.".